# නාට්‍ය හා රංගකලාව

## 09 ශ්‍රේණිය

### 02 වන වාරය



## සැකසුම :

නිවිතිගල කලාපීය නාට්‍ය හා රංගකලා ගුරු එකමුතුව

W.N ඉරේෂා විජේසුන්දර,

L.H සුදේෂා ලක්මාලි,

ර/නිවි/අයගම රාහුල විද්‍යාලය.

## සංස්කරණය :

M.D උත්පලා ධනංජනී,

ර/නිවි/කලවාන ජාතික පාසල

සදීශා ජයසූරිය,

ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය

## අධීක්ෂණය -

ප්‍රියංවදා ගොඩගේ,

ගුරු උපදේශක ( නාට්‍ය හා රංගකලා )

නිවිතිගල අධ්‍යාපන කාර්යාල

## මෙහෙයවීම-


මනෝරි උග්ගලගේ,

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

(සෞන්දර්ය)

නිවිතිගල අධ්‍යාපන කාර්යාලය





**නිපුණතාව 4.0 : නාට්‍ය හා රංගකලාව විෂයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.**
**නිපුණතා මට්ටම 4.2 : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ නාට්‍යකරුවන් පිළිබඳව විමසයි.**

# දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය

## එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍යනිර්මාණ

එදිරිවීර සරච්චන්ද්‍ර මහතා 1914 ජුනි මස 03 වන දින ගාල්ලේ දී උපත ලැබී ය. ගල්කිස්සේ ශාන්ත තෝමස්, පානදුර ශාන්ත ජෝන්, ගාල්ලේ ශාන්ත ඇලෝෂියස් යන විද්‍යාලවලින් ඉගෙනුම ලබා කොළඹ විශ්ව විද්‍යාලයට අධ්‍යාපනයට පිවිස ඇත. අවුරුදු ගණනාවක්ම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් ලෙස ද ප්‍රංශයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස ද කටයුතු කළේ ය.



1940 දශකය වන විට විශ්ව විද්‍යාලය තුළ සිංහල නාට්‍ය පිළිබඳ ව උද්යෝගයක් ඇති aකිරීම සඳහා මහාචාර්යය එදිරිවීර සරච්චන්ද්‍රයන් විශාල කැපවීමකින් කටයුතු කළේ ය. සිංහල සාම්ප්‍රදායික ගැමි නාට්‍ය කලාව ආශ්‍රය කර ගනිමින් පර්යේෂණ රාශියක් සිදු කරමින් එතුමා සිංහල නාට්‍යයේ නව ආකෘතියකි බිහි කළේ ය.

1956 දී නාඩගම් කලාවේ ආභාසය ලබා ගනිමින් සිය ප්‍රථම නාට්‍ය වන මනමේ නාට්‍ය නිෂ්පාදනය කරමින් සිංහල නාට්‍ය කලාවට නව ආරම්භයක් ලබා දුන්නේය.

## සරච්චන්ද්‍රයන්ගේ නාට්‍ය අංශ හතරක් යටතේ වර්ග කළ හැක.

1. වෙනත් භාෂාවලින් ලියැවුණු නාට්‍ය ආශ්‍රිත
    - මුදලාලිගේ පෙරළිය (Le Bourgeois gentilhomme)
    - කපුවා කපෝති (The marriage)
    - හැංගි හොරා (Importance of Being Earnest)
    - වළහා (Bear)
    - මඟුල් ප්‍රස්ථාව (Proposal)
    - මැනේජර් (The Anniversary)
    - වෙද හටන (නියුමාන් ජුබාල් සමඟ) (Malady Imaginaries)

**2. ජනකතා පුරාවෘත හා වෙනත් කතා**

- සිංහබාහු
- පේමතෝ ජායතී සෝකෝ (ස්වර්ණතිලකා හා උද්දාල කතාව)
- හස්තිකාන්ත මන්තරේ (උදයන හා වාසුලදත්තා කතාව)
- වෙල්ලවැහුම්
- ඒකට මට හිනා හිනා
- එලොව ගිහින් මෙලොව ආවා

**3. ජාතක කතා පදනම් කොටගත් නාට්‍ය**

- පබාවති - කුස ජාතකය
- වෙස්සන්තර - වෙස්සන්තර ජාතකය
- මනමේ - චුල්ල ධනුද්ධර ජාතකය
- ලෝමහංස - මහා පදුම ජාතකය
- කදා වළලු - සේරිවාණිජ ජාතකය
- බව කඩතුරාව - ස්වර්ණ හංස ජාතකය

**4. ස්වතන්ත්‍ර නාට්‍ය**

- වඳින්න ගිය දේවාලය
- බහින කලාව
- වටපුළුවේ ගෙවල් බිඳලා

# එදිරිවීර සරච්චන්ද්‍ර නාට්‍ය නිර්මාණ

- 1954 දී ගුවන් විදුලිය නාට්‍යයක් ලෙස ප්‍රචාරය වූ, 1958 දී වේදිකා නාට්‍යයක් ලෙස නිෂ්පාදනය කෙරුණු

**රත්තරං නාට්‍ය**

දේශීය තොවිල් සම්ප්‍රදාය ආශ්‍රය කර ගැනීම, මිනිස් දුබලතා විනිවිද දැකීම, තෘෂ්ණාව හා වෛරය මිනිසා විනාශය කරා මෙහෙයවන ආකාරය, ගැමි කතා වස්තුවක් යොදා ගැනීම, හාස්‍යෝත්පාදක නාට්‍යයක් වීම මෙහි දක්නට ලැබේ.

**කදා වළලු නාට්‍ය**

මුල දී ගුවන් විදුලි නාට්‍යයක් ලෙස **රන්තලයේ කතාව** නමින් ප්‍රචාරය වූ මෙය 1958 දී නිෂ්පාදනය කෙරුණු නාට්‍යයකි. සේරිවාණිජ ජාතකය ආශ්‍රය කර ගැනීම, නාඩගම් සම්ප්‍රදායයෙන් නාට්‍යයක් වීම දක්නට ලැබේ.

**එලොව ගිහින් මෙලොව ආවා - 1959**

ගායන සම්ප්‍රදායය යොදා ගැනීම, නාට්‍යමය උද්දීපනය කිරීම සඳහා නර්තනය භාවිත කිරීම, ගැමි ජන රංගනයෙන් ආභාසය ලැබීම, හාස්‍ය හා උපහාසය මුඛ්‍ය රසය කර ගැනීම, ගැමි ජන විඥාණය නිරූපණය කිරීම මෙහි දක්නට ලැබේ.

**වෙල්ලවැහුම් - 1960**

ගැමි ජන රංගනයේ ආභාසය ලබා ගැනීම, ජන කතාවක් උපයෝගී කර ගැනීම, උත්ප්‍රාසය කුළු ගැන්වීම, ජීවිතය පිළිබඳ ව ඇති ගැමියාගේ උපේක්ෂාවාදී දෘෂ්ටිය මෙහි දැකිය හැක.

**හස්තිකාන්ත මන්තරේ - 1960**

ස්වතන්ත්‍ර නිර්මාණයක් වීම, පාලකයන්ගේ හා උපදේශකයන්ගේ මානසිකත්වය අතර ඇති වන අසංවිහිත හා අසංතුලිතභාවය පිළිබිඹු වීම, රාජ්‍ය පාලකයාගේ බුද්ධිය අවමානයට පාත්‍ර වීම, කාලීන තේමාවක් සහිත වීම, හාස්‍ය ජනිත වීම, උපහාසය ධ්වනිය වීම වැනි ලක්ෂණ මෙහි දක්නට ලබේ.

**ඒකට මට හිනා - 1961**

උම්මග්ග ජාතකයේ සඳහන් කාලගෝල කථා වස්තුව ඇසුරින් නිර්මාණය වීම, ජන කථා සම්ප්‍රදාය භාවිතා කිරීම, සියුම් හාස්‍යය ජනනය කිරීම, විරිඳු ගායනා යොදා ගැනීම මෙහි දක්නට ලැබේ.

**සිංහබාහු - 1961**

මනමේ නාට්‍යයෙන් පසු බිහි වූ නාට්‍ය කලාවේ සුවිශේෂ සන්ධිස්ථානයක් වීම, නාට්‍ය ධර්මී සම්ප්‍රදාය, රසිකයන්ට උසස් ම කාව්‍යමය හා සංගීතමය ආස්වාදයක් ලබා දීම, විශිෂ්ට දෘශ්‍ය කාව්‍ය ලක්ෂණ පළ කිරීම, නාඩගම් ශෛලියේ තවත් අත්හදා බැලීමක් වීම, විශ්ව වටිනාකමක් සහිත වස්තුවක් තෝරා ගැනීම, පරම්පරා දෙකක සිතුම් පැතුම් හා මතිමතාන්තර අතර පවත්නා පරස්පර බව හුවා දැක්වීම, කලාත්මක හා මනෝවිද්‍යාත්මක දෘෂ්ටියක් සහිත වීම ආදී විශේෂතා රාශියක් මෙම නාට්‍යයෙහි දක්නට ලැබේ. පිය-පුතු සෙනෙහස, අඹු සැමි සෙනෙහස ආදී මානව සම්බන්ධතා ඉස්මතු කිරීම, සුවිශේෂ චරිත නිර්මාණයක් සිදු කිරීම, ක්‍රෝධය, වෛරය වැනි දූෂිත චිත්ත ස්වභාවයන් හමුවේ පිවිතුරු සිතිවිලි නිසා හටගත් අචල ශක්තිය දෙදරා යන ආකාරට ආදී කරුණු ද සිංහබාහු නාට්‍ය තුළින් ඉස්මතු වේ.

**මහාසාර නාට්‍ය - 1968**

සත්ත්ව සංහතියට අවේණික ලක්ෂණ විවරණය කිරීම, ස්ත්‍රී චිත්ත ස්වභාවය විවරණය කිරීම ආදී ලක්ෂණ මෙම නාට්‍යයේ දක්නට ලැබේ.

**පේමතෝ ජායතී සෝකෝ - 1969**

ගීත නාට්‍යයක් ලෙස රචනා වීම, දේශීය සංගීතයට හානි නොවන සේ බටහිර ලක්ෂණ යොදා ගැනීමට උත්සාහ කිරීම, ඔපෙරා ලක්ෂණ දේශීය ඌරුවට ගැලපෙන සේ යොදා ගැනීමට උත්සාහ කිරීම ආදිය ඉස්මතු කෙරෙන මෙම නාට්‍යයේ ප්‍රේමය හා බැඳි තෘෂ්ණාව විසින් මනස මෙහෙයවනු ලබන ආකාරය හා ප්‍රේමය බිඳ වැටීමේ දී අත් විඳින විප්‍රලම්භය ද ප්‍රකට වේ.

**වෙස්සන්තර ගීතාංග නාටකය - 1980**

නව සමාජ පරිවර්තනව නිසා මිනිස් චර්යාව වෙනස් වෙමින් පාරම්පරික සාරධර්ම තර්ජනයකට ලක් ව ඇති අවස්ථාවේ පරාර්ථ චර්යාව පිළිබඳ ව සමාජය අවධි කිරීමේ අරමුණකින් ලියැවුණකි. රාජ්‍ය පාලනයේ දී තනි තීරණ ගැනීම, පොදු වස්තූන් පරිහරණය කිරීම ආදිය නිසා ගැටලු ඇතිවන ආකාරය, මහජන කැළඹීම් නිසා ගැටලු ඇති වන ආකාරය ආදියත්, පරමාදර්ශී රාජ චරිතයක් යනු කවරේ ද යන්නත් පෙන්වාදෙමින් දේශපාලනයේ එන දෙබිඩි චරිත සරදමට ලක් කිරීම මෙයින් සිදු කොට ඇත.

**ලෝමහංස - 1985**

වියපත් පුරුෂයෙකු තරුණ ස්ත්‍රියක පාවා ගැනීමෙන් සිදු වන ව්‍යසනය කියා පාන්නකි.

**බව කඩතුරාව - 1989**

ස්වර්ණහංස ජාතකය ඇසුරින් නිපදවා තිබේ. සමාජ අරගලය ප්‍රබල සංකල්ප රූප මඟින් ඉදිරිපත් කරයි. අල්පේච්ඡ බව, ලද දෙයින් සතුටු වීම, පරෝපකාරය, දයාව, කරුණාව ආදී උතුම් පුරුෂාර්ථ, භෞතික සම්පත් කෙරෙහි ඇති ආසක්ත බව නිසා වෙනස් වන ආකාරය මින් නිරූපිත වේ.


**මනමේ නාට්‍ය**

https://youtu.be/wJ2Mi09hGuI

https://www.google.com/search?q=ediriwewra+sarachchandra+drama&oq=ediriwewra+sarachchandra+drama&aqs=chrome..69i57j46i13j0i22i30l2.16898j0j9&client=ms-android-huawei-rev1&sourceid=chrome-mobile&ie=UTF-8



# දයානන්ද ගුණවර්ධන (1934-1993)



- **ජීවන තොරතුරු**

1934 ඔක්තොම්බර් මස 15 වැනි දින පන්නිපිටියේ ලියනගොඩ දී උපත ලද මොහු ප්‍රාථමික අධ්‍යාපනය උඩුගම්පොල විද්‍යාලයෙන් ද, ද්විතියික අධ්‍යාපනය වේයන්ගොඩ විද්‍යාලයෙන් සහ කොළඹ ආනන්ද විද්‍යාලයෙන් ලබා ගත්හ. පාසල් කාලයේ සිට ම නාට්‍ය සංගම්හි ක්‍රියාකාරී සමාජිකයෙක් වූ මොහු ශිෂ්‍යභට කණ්ඩයේ නායකත්වය ද ඉසිලී ය. විවෘත අංශයේ ඩී.බී.ජයතිලක හා අමරසේන කලා සම්මානයන් ලබා ගැනීමට සමත්විය. 1957 දී උසස් අධ්‍යාපනය සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් ව උපාධිය ලබාගත්හ. 1967.09.28 දින අයිරාංගනී රණතුංග සමඟ අතිනත ගත්හ. චක්‍රායුධ කීර්ති ගුණවර්ධන, අභිමංගල ගුණවර්ධන හා වසන්තප්‍රිය ගුණවර්ධන යන දරුවන් තිදෙනෙක්ගේ පියෙකි. 1961-1992 දක්වා ගුවන්විදුලි සංස්ථාවේ වැඩසටහන් අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් කටයුතු කළහ.

- **නාට්‍ය නාර්මාණ**

  - ස්වර්ණතිලකා - 1958

    කැගලු විද්‍යාලයේ නාට්‍ය සංගමය (සිංහල ගැමි නාට්‍ය අනුගමනය කරමින් ලයනල් අල්ගම විසින් සංගීත අධ්‍යක්ෂණ කළහ.)

  - පරාස්ස - 1959

- නරිබෑනා - 1960 - ප්‍රථම නිෂ්පාදනය තර්ස්ටන් විද්‍යාලයේ නාට්‍ය සංගමය.
  1961- දෙවන නිෂ්පාදනය

- කාමරේ පොරේ - 1962
  "Box and Cox" නම් ඉංග්‍රීසි නාට්‍ය අනුවර්තනයකි.

- ඇමතිපට්ටම - 1960
  "Golemanov" නම් ඉංග්‍රීසි නාට්‍ය අනුවර්තනයකි.

- පිංගුත්තර - 1961
  කොළඹ විශ්ව විද්‍යාලයේ නාට්‍ය සංගමය

- බක්මහ අකුණු - 1962
  "Marriage of Figaro" කැරකෙන වේදිකාව හඳුන්වාදෙමින් ප්‍රංශ නාට්‍යහි අනුවර්තනයකි. හාස්‍ය රසයෙන් අනූන වූවකි.

- දෙන්නා දෙපොල් - 1964

- ජසයා හා ලෙන්චිනා - 1965
  සාම්ප්‍රදායික ගැමි නාටක වන කෝළම් ආශ්‍රිත කරගෙන ගැමි රංග ශෛලීන් ඉදිරිපත් කර ඇත.

- ජීවන වංචාව හෙවත් ඉබිකට්ට - 1965
  කාර්යාල කම්කරුවෙකු ණයක් ලබා ගැනීමට ගත් උත්සාහයත් එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු රෝගියෙකු වීමත් පිළිබිඹු කෙරේ.

- විකාරයේ අකාරය - 1967
  ලස්සන පුවත්පතෙහි අනුග්‍රහයෙන් පැවැත්වූ නාට්‍ය උත්සවය සඳහා

- කබායේ හබේ - 1971

- පද්මාවතී - 1974
  චාල්ස් ඩයස්ගේ ප්‍රථම නිෂ්පාදනය ලක්ෂ්මන් ජයකොඩි විසින් නැවත සංස්කරණය කරන ලදී.

- ගජමන් පුවත - 1975
  මාතර යුගයේ ජීවත් වූ ප්‍රකට කිවිඳියක ඇසුරින් නිර්මාණය කර ඇත.

- බංකු නාට්‍යය - 1977

  මහජන බැංකුවේ 10 වන සංවත්සරය වෙනුවෙනි.

- මධුර ජවනිකා - 1983

  සාමය සඳහා වූ සම්මානය 1984 දී ලබාගත්හ.

- ආනන්ද ජවනිකා - 1986

  1987 දී වේදිකා නාට්‍ය සම්මාන උළෙලෙ දී හොඳම අධ්‍යක්ෂණය, හොඳම පිටපතට හිමි විශේෂ සම්මානය ගබාගත්හ. සහතික පත්‍ර සම්මානයෙන් හොඳම සංගීතය, හොඳම වේදිකා පරිපාලනය හා රංගනයට හිමිකරගත්හ.

- මතක බහක්ත - 1990

https://www.google.com/search?q=dayananda&client=ms-android-huawei-rev1&sxsrf=ALeKk01sMiOX9BBZefPDlRNM7d2dN4L8Qw%3A1620976393906&ei=CSOeYJrvNseG4-EPwKqP4Ak&gs_ssp=eJzj4tLP1TdISS_IzSkxYPTiTEmsTMxLzEtJBABZDQe9&oq=dayananda&gs_lcp=ChNtb2JpbGUtZ3dzLXdpei1zZXJwEAEYADIICC4QkQIQkwIyCAguEMcBEK8BMggILhDHARCvATICCAAyCAguEMcBEK8BMgIIADICCAAyAggAOgcIIxCwAhAnOgQILhANOgYIABANEB46CAgAEAgQDRAeOgUIABDNAjoHCCMQ6gIQJzoECCMQJzoFCAAQkQI6BAguEEM6CAgAELEDEIMBOgUILhCRAjoECAAQQzoCCC46CAguELEDEIMBUJ0bWJ0qYO0yaAJwAHgAgAGeA4gB8BeSAQcyLTYuMy4xmAEAoAEBsAEPwAEB&sclient=mobile-gws-wiz-serp

https://youtu.be/erqS6o0VkyU

# ගුණසේන ගලප්පත්ති (1927- )



- **ජීවන තොරතුරු**

1927 ජුනි මස 07 වැනි දින මාතර දිකවැල්ලේ දී උපත ලද මොහු දික්වැල්ල මධ්‍ය විද්‍යාලයෙන් හා මාතර රාහුල විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරූහ. පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් ව ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධිය හැදෑරූහ. එදිරිවීර සරච්චන්ද්‍රය හා චාර්ල්ස් සිල්වා සමඟ නාට්‍යයට සම්බන්ධ වී කටයුතු කළහ. ස්පාඤ්ඤ, ජපානය හා රුසියාව දී රටවල සංචාරය කරමින් විදේශීය නාට්‍ය පිළිබඳ ව මෙන් ම ස්ටැනික් ලාවුස්කි රංගක්‍රම පිළිබඳ ව මැනවින් අධ්‍යයනයක යෙදුණහ. 1955 කෝට්ටේ ආනන්ද ශාස්ත්‍රාලයේ ගුරුවරයෙකු ලෙස සේවය කළහ.

- **නාට්‍ය නිර්මාණ**

ගුණසේන ගලප්පත්තිගේ ප්‍රථම නාටකය ලෙස සිංහල ගැමිරංග සම්ප්‍රදායන් ඇසුරින් 1957 නිෂ්පාදිත සඳකිඳුරු හැඳින්විය හැකිය. ගාර්ෂියා ලෝර්කාගේ යෙර්මා නාට්‍ය ඇසුරින් 1962 දී මූදුපුත්තු නාට්‍ය නිශ්පාදනය කරන ලදී.


- 1956 - සත්ත්ව කරුණාව (ආනන්ද ශාස්ත්‍රාලයේ සිසුන් සමඟ)
- 1957 - සඳකිඳුරු (පැරණි නාඩගම් ශෛලිය අනුව සකස් කර ඇත.)
- 1962 - වළහැඩියා (ඇන්ටන් චෙකෝව්ගේ වළහා නාට්‍යයේ අනුවර්තනයකි.)
  - 1962 - මූදු පුත්තු (ධීවර ගම්මානයක ජීවත් වන 'සරා', ඇගේ සැමියා වන තේගිරිස් හා ඔහුගේ
    මලණුවන් වන 'දියෝනිස්' යන ත්‍රිත්වය යොදාගනිමින් සරා දරුවකු ලබා ගැනීමට දරන උත්සාහයත්, තේගිරිස් අතින් දරුවා මිය යාමත් පිළිබඳ ඛේදාන්තය විග්‍රහ කරන්නේ ගීතවත් බස් වහරක් මඟින් ප්‍රේක්ෂකයා ඇදබැඳ ගනිමිනි.
- 1963 - දේවතාඑළි (බර්ටෝල්ට් බ්‍රෙස්ට්ගේ ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන් හි අනුවර්තනයකි.)
- 1965 - මහා හේනේ රීරි යකා
- 1966 - ලියතඹරා (දේශපාලන තේමාවක් සහිත ව එළි දකියි)
- 1969 - තාත්තා (දේශීය සංස්කෘතියෙහි දක්නට ලැබෙන කුටුම්බයේ අන්‍යෝන්‍ය සහ
  සම්බන්ධය පිළිබිඹු කරයි.)
- 1976 - දැස නිසා (ස්වතන්ත්‍ර)
- 1963 - කාලි යකින්නි (ගුවන්විදුලි නාට්‍යක් ලෙස)

https://www.google.com/search?gs_ssp=eJzj4tLP1TcwKrI0rbQ0YPQSTi_NSyxOzUtUSE_MSSwoSCwpqQQAqAILCw&q=gunasena+galappatty&oq=gunasena+gala&aqs=chrome.1.69i57j46j0j0i22i30.7210j0j9&client=ms-android-huawei-rev1&sourceid=chrome-mobile&ie=UTF-8

https://youtu.be/axrtpgjgouY



# රංජිත් ධර්මකීර්ති



රංජිත් ධර්මකීර්ති යනු සම්මානලාභී නාට්‍ය රචකයෙකු හා අධ්‍යක්ෂවරයකු මෙන් ම නවකතාකරුවකු පරිවර්තනකයකු හා ශාස්ත්‍රීය ග්‍රන්ථ සම්පාදකවරයෙකු ද වේ. පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය මෙන් ම සංගීතමය නාට්‍ය ද ඔහු විසින් නාට්‍ය ක්ෂේත්‍රයට දායාද කර ඇත. ඔහුගේ ඉතා ම ජනප්‍රිය කෘති අතර සංගීතමය නාට්‍ය ද ඔහු විසින් නාට්‍ය ක්ෂේත්‍රයට දායාද කර ඇත. ඔහු ගේ ඉතා ම ජනප්‍රිය කෘති අතර,

- හිරු නැති ලොව - පරිවර්තන නාට්‍යය
- මෝදර මෝල - ස්වතන්ත්‍ර නාට්‍යය
- මේස - ස්වතන්ත්‍ර නාට්‍යය යන නාට්‍ය සම්මාන දිනා ඇත.
- ඔහුගේ සංගීතමය නාට්‍ය අතර ‘අංගාරා ගඟ ගලා බසී.’ හා ‘ආඬි රැළේ නාඩගම’ ප්‍රසිද්ධ ඒවා ය.
- “හස්ති රාජ මහත්තයා” නම් වූ අසම්මත නාට්‍යය
- අන්තන් චෙකෝව්ගේ “චෙරි උයන” නාට්‍යය ද විශේෂ වේ.

https://www.google.com/search?q=ranjith+dharmakeerthi&oq=ranjith+dhar&aqs=chrome.1.69i57j0l2j0i67j0.4240j0j9&client=ms-android-huawei-rev1&sourceid=chrome-mobile&ie=UTF-8

**මොදර මෝල නාට්‍ය**

https://youtu.be/wBh0uljLNm0

**නිපුණතාව 4.0 : නාට්‍ය හා රංගකලාව විෂයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.**
**නිපුණතා මට්ටම 4.3 : ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංගනශිල්පීන් පිළිබඳව විමසයි.**

## ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ රංගන ශිලපීන්

1. **මාලනී රණසිංහ**




සිංහබාහු නාට්‍යයේ ආරම්භයේ සිට (1961) ‘සුප්පා දේවි’ චරිතය නිරූපණය කළාය. දශක කීපයක් ම වේදිකාවේ රැඳී සිටි ඇය 1985 දී කේ.බී.හේරත්ගේ මායා දේවි නාට්‍යයේ දෙනගම හාමිනේ (දුර්ගා) ගේ චරිතය නිරූපණය කරමින් එම වසරේ සාම නාට්‍ය උලෙළ සහ රාජ්‍ය නාට්‍ය උලෙළ යන නාට්‍ය උත්සව දෙකේ දී ම හොඳ ම සහාය නිළියට හිමි සම්මානය දිනාගත්තා ය. 1980 වෙස්සන්තර ගීත නාටකයේ මද්‍රි දේවියගේ චරිතය නිරූපණය කළේ ද මාලනී රණසිංහ ය.

**මාලනී රණසිංහ**

https://youtu.be/5FaL4rkwjW8

https://youtu.be/7l-73E3Zxos

## 2. එඩ්මන්ඩ් විජේසිංහ

1956 මනමේ නාටකයේ ප්‍රථම දර්ශනයේ සිට වර්ෂ ගණනාවක් ම එහි වැදි රජුගේ චරිතය රඟපාමින් මොහු සිය විශිෂ්ට රංගන කුශලතාව දක්වා ඇත. ඒ අතර ම එම නාට්‍යයේ ම රාජගුරුගේ චරිතය ද ඔහු නිරූපණය කොට ඇත. 1958 දී එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'කදා වළලු' නාට්‍යයේ සේරිවාණිජ චරිතය රඟපාමින් ඔහු තව දුරටත් ප්‍රේක්ෂක ආකර්ශනය දිනා ගත්තේ ය.

## 3. මාක් ඇන්ටනී ප්‍රනාන්දු



මාක් ඇන්ටනි ප්‍රනාන්දු

මාක් ඇන්ටනී ප්‍රනාන්දු 1960 දශකයේ බොහෝදෙනාගේ අවධානයට ලක්වන්නේ සිංහබාහු නාට්‍යයේ සිංහයාගේ චරිතයට පණ දීම නිසාය. 1961 වර්ෂයේ දී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් නිෂ්පාදනය කරන ලද සිංහබාහු නාට්‍යයේ ආරම්භක වකවානුවේ සිංහයාගේ චරිතය වේදිකාවේ නිරූපණය කරමින් මාක් ඇන්ටනි ප්‍රනාන්දු ප්‍රේක්ෂකයාට අමතක නොවන චරිතයක් බවට පත් විය. 'ඉඳහිට යන ගමන්' 'මමත් මිනිහෙක්' යන නාට්‍ය නිෂ්පාදනය කරමින් ඔහු නාට්‍ය ක්ෂේත්‍රයේ තව දුරටත් ඉදිරියට ගොස් ඇත.

## 4. නිශ්ශංක දිද්දෙණිය




ශ්‍රී ලංකාවේ නාට්‍ය වේදිකවේ අමරණීය නමක් තබමින් මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යවලට රංගනයෙන් දායක වූ නිශ්ශංක දිද්දෙණිය 1970 වර්ෂයේ දී "සිංහබාහු" නාට්‍යයට සම්බන්ධ වන්නේ සිංහබාහුගේ චරිතය නිරූපණය කරමිනි. දශක තුනකට ආසන්න කාලයක් ඔහු සිංහබාහු චරිතය රඟපෑම වාර්තාගත සිද්ධියකි. "පේමතෝ ජායතී සෝකෝ" නාට්‍යයේ පිංගලගේ චරිතය ද වෙස්සන්තර ගීත නාටකයේ සක්දෙව් චරිතය ද, ලෝමහංස ජාතකයේ බරණැස් රජුගේ චරිතය ද ඔහු රඟපෑවේ ය. එසේම දයානන්ද ගුණවර්ධනගේ ගජමන් පුවත නාට්‍යයේ ඇලපාත මුදලිගේ චරිතය ඔහු විසින් නිරූපණය කරන ලද අමතක නොවන චරිතයකි.

**නිශ්ශංක දිද්දෙණිය**

https://youtu.be/hRpG5ZN8QK8

https://youtu.be/uVRz6WCN6a8

## 5. සාලමන් ෆොන්සේකා



දයානන්ද ගුණවර්ධනගේ නාට්‍ය බොහෝ ගණනකට රංගනයෙන් දායක වී ඇති සාලමන් f*dන්සේකා නරිබෑණා දෙවැනි නිෂ්පාදනයේ දී නරියාගේ චරිතය නිරූපණය කරමින් ප්‍රේක්ෂක ආකරෂණය දිනා ගත්තේ ය එසේ ම “ජීවන වංචාව හෙවත් ඉබිකට්ට” නාට්‍යෙය් ඔහු සාරගර්භගේ චරිතය නිරූපණය කරන අතර ජස ලෙන්චිනා නාට්‍යයේ (1965) හෙන්චාගේ චරිතය ද රඟපා තිබේ. රංගභූමි අලංකරණය හා වෙස් ගැනීවීම් පිළිබඳ ව ද ඔහු දක්ෂතා පෙන්වා ඇත.

## 6. ට්‍රිලීෂියා ගුණවර්ධන




1956 දී මනමේ නාටකයේ ප්‍රධාන චරිතය වූ මනමේ කුමරියගේ චරිතය රඟපෑවේ ට්‍රිලීෂියා ගුණවර්ධනයි. (ට්‍රිලීෂියා අබේකෝන්) වේදිකාවේ ඉහළ ම දස්කම් පෑ 1960 දී වේදිකාගත වූ සරච්චන්ද්‍රයන්ගේ ‘‘හස්තිකාන්ත මන්තරේ’’ නාට්‍යයේ වාසුල දත්තාගේ චරිතය රඟපාමින් සිය රංගන කුශලතාව තවදුරටත් පෙන්නුම් කළ ය. ට්‍රිලීෂියා ටෙලිනාට්‍යවලට හා සිනමාවට ද රංගනයෙන් දායක වී ඇත.

## 7. සෝමලතා සුබසිංහ (1936-2015)



1936 ජූලි මස 02 වැනි දින ගම්පහ දී උපත ලද මෙතුමිය කොළඹ මියුසියස් විද්‍යාලයෙන් හා බෞද්ධ කාන්තා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ අතර 1958 පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළත්ව සිංහල ආර්ථික විද්‍යාව හා ඉතිහාසය පිළිබඳ ව ප්‍රථම උපාධිය ලබාගත්හ. 1962 දී උපාධි ගුරුවරියක ලෙස පත්වීම් ලැබ 1970 නාලාන්දා විද්‍යාලයේ ගුරුවරියක ලෙස ද සේවය කළහ. විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය ලබන අතර එදිරිවීර සරච්චන්ද්‍රගේ ඇසුර ලබමින් වයස 24 දී ඔහුගේ කෞෂල්‍යා ප්‍රනාන්දු හා ශ්‍යාමලිකා නානායක්කාර යන අයගේ දයාබර මෑණියන් විය.

ඒ අනුව යමින් 1981 දී යෞවනයන්ට හා කුඩා දරුවන්ට නාට්‍ය හුරු කරවීම සඳහා නාට්‍ය පාසලක් බිහිකළහ. නාට්‍ය රචිකායක් මෙන් ම දක්ෂ නිළියක ද වන මැය ගුනසේන ගලප්පත්තිගේ මූදු පුත්තු නාට්‍යයේ සරාගේ චරිතය නිරූපණය කළහ. විරාගය, මඩොල්දූව, මහගෙදර, තිලකා සහ තිලකා, මේ මගේ සඳයි, සුදු කළුවර මෙන් ම සිරිබෝ අයියා යන චිත්‍රපටවල මෙන්ම ඇල්ල ළඟ වලව්ව, ගම්පෙරළිය, සුබ අනාගතයක් යන ටෙලි නාට්‍යවල ද රංගනයෙන් දායක වූහ. කලාවට කළ මෙහෙය වෙනුවෙන් කලා කීර්ති හා කලාසූරි සම්මානයෙන් පුද ලැබූහ.

**නාට්‍ය නිර්මාණ**

- 1982 - විකෘති
- 1985 - පාර හරහා
- 1986 - සඳකිඳුරු
- 1990 - පවර නුවරක්
- 1991 - ඔපෙරා
- 1992 - යදම්
- 1993 - ඇන්ටිගනී
- 1998 - මවකගේ සංග්‍රාමය

**ළමා නාට්‍ය**

- 1979 - පුංචි අපට දැන් තේරෙයි
- 1979 - තොප්පි වෙළෙන්දා
- 1981 - ගමරාළ දිව්‍යලෝකෙට
- 1981 - රත්මලී
- 1988 - ඔට්ටුයි

- 1995 - හිමකුමරිය
- 2003 - වළස් පවුල

**චරිත නිරූපණ**

- සරච්චන්ද්‍ර - රත්තරන් (චරිත නිරූපණය)
- සරච්චන්ද්‍ර - එළොව ගිහින් මෙලොව ආවා (චරිත නිරූපණය)
- ගුණසේන ගලප්පත්ති - මූදු පුත්තු (චරිත නිරූපණය)
- රංජිත් ධර්මකීර්ති - ලියතඹරා (චරිත නිරූපණය)
- හෙන්රි ජයසේන - දිරිය මව හා ඇගේ දරුවෝ (චරිත නිරූපණය)
- රංජිත් ධර්මකීර්ති - වෙරි උයන (චරිත නිරූපණය)
- රංජිත් ධර්මකීර්ති - හිරු නැති ලොව (චරිත නිරූපණය)
- ධම්ම ජාගොඩගේ - වෙස් මුහුණු (චරිත නිරූපණය)
- දයානන්ද ගුණවර්ධන - නරි බෑණා (චරිත නිරූපණය)

**සෝමලතා සුභසිංහ**

https://youtu.be/6nbnXyIEY0A

# 8.සිරිල් වික්‍රමගේ



සිනමාවේ ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ මෙන් ම වේදිකාවේ ද එක සේ දස්කම් පෑ සිරිල් වික්‍රමගේ විසින් රඟපාන ලද විශිෂ්ට ම චරිතයක් ලෙස ගුණසේන ගලප්පත්තිගේ "මූදු පුත්තු" නාට්‍යයෙහි "තේගිරිස්" ගේ චරිතය හඳුන්වා දිය හැකි ය. දරුවකු නොලබන ඔහු සරා විසින් ලබා ගන්නා ලද දරුවා ද ඝාතනය කිරීමට පෙලඹෙන්නේ මිනිස් සිතෙහි ඇති සංකීර්ණභාවය ප්‍රකට කරවමිනි. සාර්ථක නළුවකු ලෙස ඔහු ප්‍රේක්ෂක අවධානය දිනාගෙන තිබේ.

**සිරිල් වික්‍රමගේ**

https://youtu.be/Pg78Cp1BL_4

# නිවිතිගල කලාපීය නාට්‍ය හා රංගකලා ගුරු එකමුතුවේ සැකසුමකි.